# අනුරාධපුර යුගයේ කෘෂි ආර්ථිකය පිළිබඳ විමර්ශනයක් (තෝරාගත් කෘති කිහිපයක් ඇසුරින්)

**තාරිකා ඩබ්.ඩී.ආර්.**[1]

අනුරාධපුර යුගයේ ආර්ථික ප්‍රවාහය තුළ ප්‍රධාන අංශයක් වශයෙන් කෘෂිකර්මාන්තය දැක්විය හැකිය. අනුරාධපුර යුගයේ කෘෂි ආර්ථික පසුබිම පිළිබඳ විමර්ශනය සිදුකිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණයි. මූලික වශයෙන් දත්ත එක්රැස් කරගැනීමේදී මූලිකව ම ක්ෂේත්‍ර නොවන ගවේෂණය භාවිතා කරන ලදී. මෙහිදී පුස්තකාල අධ්‍යයනය හා අන්තර්ජාලය මගින් තොරතුරු ලබාගැනීම සිදුවිය. අනුරාධපුර රාජ්‍ය සමයේදී පැවති පාරිසරික පසුබිම මත එකල කෘෂිකර්මාන්තයේ ස්වරූපය පිළිබඳ සාධක හමුවේ. මෙම පාරිසරික පසුබිම තුළ කෘෂිකාර්මික කටයුතු සශ්‍රීක ලෙස ව්‍යාප්ත වන්නට විය. මෙහිදී වර්ෂාව හා වාරිමාර්ග ආශ්‍රයෙන් ගොඩ - මඩ ද්විත්වයේම වගා කටයුතු සිදුවූ අතර මෙලෙස අනුරාධපුර සමයේදී වගා කටයුතු විශාල වශයෙන් සිදුකරන්නට වූයෙන් එකී ක්‍රියාවලිය සංකීර්ණ මුහුණුවරක් ගන්නා ලදී. එමෙන්ම කෘෂිකර්මාන්තය වාණිජමය වශයෙන් ද බෙහෙවින්ම වැදගත් වූවක් විය. අනුරාධපුර යුගයේ කෘෂි ආර්ථිකය පිළිබඳ කරුණු ඇතුළත් ලිඛිත මූලාශ්‍රයන් තුළින් එකල කෘෂිකාර්මික කටයුතු සිදුකෙරුණු කන්න ක්‍රමයන්, වගා කළ බෝග වර්ගයන්, ගොවිතැන් කටයුතු සිදුකළ ආකාරයන්, භාවිතා කළ උපකරණ හා මෙවලම්, ශ්‍රම භාවිතය, එකල පැවති ස්වයංපෝෂී පසුබිම, රාජ්‍ය හා කෘෂිකර්මාන්තය අතර පැවති සබඳතාවය, සමාජයේ කෘෂිකර්මාන්තය සඳහා ලැබුණු තත්ත්වය, කෘෂිකර්මාන්තයේ යෙදී සිටි වැසියාගේ මානව ආකල්පයන්, කෘෂිකර්මාන්තය හා ගවපාලනය අතර සබඳතාවය, ජල සම්පාදනයන් සිදුවූ ආකාරය මෙන්ම කෘෂිකාර්මික බදු, කෘෂිකාර්මික කටයුතු පවත්වාගෙන යාම සඳහා වූ නිලධාරීන්, නීති සම්ප්‍රදායන් ආදී මැදිහත්වීම් පිළිබඳව ද වටහා ගැනීමට උපකාරී වන්නේය. පර්යේෂණ කාර්යය සාර්ථක කරගැනීම අරභයා එහිදී පර්යේෂණ ක්‍රමවේදය ලෙස ප්‍රධාන වශයෙන් අනුරාධපුර සමය පිළිබඳ සාධක ඇතුළත් සීහලවත්ථුප්පකරණය, විසුද්ධිමාර්ගය, සද්ධර්මාලංකාරය ආදී ප්‍රාථමික සාහිත්‍යමය මූලාශ්‍ර ත්‍රිත්වයක් තෝරාගනිමින් පරිශීලනය සිදුකරන ලදී. එමෙන්ම ඒවායේ සඳහන් කරුණු සනාථ කිරීමටත්, තවදුරටත් අධ්‍යයනයන් සිදුකරලීමටත්, අනෙකුත් ප්‍රාථමික සාහිත්‍යමය මූලාශ්‍ර මෙන්ම ශිලාලේඛන සාධක ද උපයෝගී කරගනිමින් ද්විතියික මූලාශ්‍රයන් ද පරිශීලනය සිදුකරන ලදී. මේ අනුව මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටළුව වන්නේ තෝරාගත් මූලාශ්‍ර ඔස්සේ අනුරාධපුර යුගයේ කෘෂි ආර්ථික පසුබිම පිළිබඳ නිශ්චිත සාධක කෙතරම් දුරට පිළිඹිබුවේ ද? එකී තොරතුරු අනෙකුත් මූලාශ්‍ර ඔස්සේ සනාථ වේද? අනුරාධපුර යුගයේ කෘෂිකාර්මික පසුබිමෙහි පාරිසරික පසුබිම කුමනාකාර වේද? මෙන්ම අනුරාධපුර යුගයේ පැවති කෘෂිකාර්මික වටපිටාව අනාවරණය කර ගැනීමයි. සමස්තයක් වශයෙන් අනුරාධපුර යුගයේ දියුණු ස්වයංපෝෂී කෘෂි ආර්ථික පසුබිමක් පැවති බව නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද :** අනුරාධපුර යුගය, කෘෂිකර්මාන්තය, කෘෂි ආර්ථිකය, ස්වංයපෝෂී, ජල සම්පාදනය

---

[1]පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය. rasithari1996@gmail.com